## විශේෂ සටහන 13

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග : 2012[1]

### මූර්ත අංශය

2012 පෙබරවාරි 12 - ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි සිල්ලර මිල ගණන් පහත පරිදි වැඩිකරන ලදී.

- පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 149 දක්වා, රුපියල් 12 කින්
- ඩීසල් ලීටරයක මිල රුපියල් 115 දක්වා, රුපියල් 31 කින්
- භූමිතෙල් ලීටරයක මිල රුපියල් 106 දක්වා, රුපියල් 35 කින්

2012 පෙබරවාරි 14 - මගී ප්‍රවාහන බස් ගාස්තු සියයට 20 ක සාමාන්‍ය ප්‍රතිශතයකින් වැඩි කරන ලදී.

2012 පෙබරවාරි 16 - මාසික විදුලි බිල්පතට පහත පරිදි ඉන්ධන ගැලපුම් ගාස්තුවක් හඳුන්වා දෙන ලදී.

| අංශය | | ඉන්ධන ගැලපුම් ගාස්තුව (ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|
| ගෘහස්ත පාරිභෝගිකයන් | | |
| මසකට - ඒකක | 0 - 30 | 25 |
| මසකට - ඒකක | 31 - 60 | 35 |
| මසකට - ඒකක | 60 ට ඉහළ | 40 |
| කර්මාන්ත | | 15 |
| හෝටල් | | 15 |
| පොදු කාර්යයන් | | 25 |

2012 මැයි 04 - ග්‍රෑම් 400 සම්පූර්ණ යොදය සහිත කිරිපිටි පැකට්ටුවක උපරිම සිල්ලර මිල රුපියල් 325 දක්වා රුපියල් 61 කින් ද කිලෝග්‍රෑම් 1 සම්පූර්ණ යොදය සහිත කිරිපිටි පැකට්ටුවක මිල රුපියල් 810 දක්වා රුපියල් 163 කින් ද වැඩි කරන ලදී.

- කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ත එල්.පී.ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 2,396 දක්වා රුපියල් 350 කින් වැඩි කරන ලදී.

2012 ජූලි 14 - කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ත එල්.පී.ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 2,246 දක්වා රුපියල් 150 කින් අඩු කරන ලදී.

2012 ඔක්තෝබර් 01 - ගෘහස්ත පාරිභෝගිකයන් සඳහා ජලගාස්තු සියයට 60 ක සාමාන්‍ය ප්‍රතිශතයකින් වැඩි කරන ලදී.

2012 දෙසැම්බර් 15 - පෙට්‍රල් ලීටරයක සිල්ලර මිල රුපියල් 159 දක්වා රුපියල් 10 කින් වැඩි කරන ලදී.

2013 ජනවාරි 06 - කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ත එල්.පී.ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 2,396 දක්වා රුපියල් 150 කින් වැඩි කරන ලදී.

2013 පෙබරවාරි 23 - ඛනිජ තෙල් නිෂ්පාදනයන් හි සිල්ලර මිල ගණන් පහත පරිදි වැඩිකරන ලදී.

- පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 162 දක්වා, රුපියල් 3 කින්
- ඩීසල් ලීටරයක මිල රුපියල් 121 දක්වා, රුපියල් 6 කින්

### විදේශ අංශය

**වෙළෙඳ සහ තීරු බදු**

2012 ජනවාරි 01 - අහස් යානා, නැව්, කෘතිම පාද, කිහිලිකරු, රෝද පුටු, ශ්‍රවන ආධාරක, එම ආධාරක සඳහා වන අනෙකුත් කොටස්, දෘශ්‍යාබාධිතයින් සඳහා සුදු සැරයටි, බ්‍රේල් යතුරු ලියන සහ කොටස්, බ්‍රේල් ලියන පත්‍රිකා සහ පුවරු, ඇව කඳන්, මහන නූල් හා එළවළු කෙඳි ආශ්‍රිත නූල් හැර අනෙකුත් නූල් සහ රෙදිපිළි යනාදී ආනයන, ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

[1] 2012 වසර තුලදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග මෙයට ඇතුලත් වේ. 2013 වසරේ පළමු මාස 3 තුලදී ක්‍රියාත්මක කරන ලද සහ 2013 වසර තුලදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය වෙනස්කම් හා ක්‍රියාමාර්ග ද මීට ඇතුලත් වේ.

- පහත සඳහන් අයිතමයන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
    - ශබ්ද විකාශන යන්ත්‍ර හා ඇම්ප්ලිෆයර්ස්, ශ්‍රව්‍ය සංඛ්‍යාත විද්‍යුත් වර්ධක හා උපාංග, සිනමා මාධ්‍ය උපකරණ, ඩිජිටල් භාවිතා කරන කියවීමේ උපකරණ ආදිය ආනයනය
    - හරිතාගාර, පොලි ටනල්ස් සහ හරිතාගාර හා පොලි ටනල්ස් ඉදිකිරීම සඳහා වගාකරුවනට අවශ්‍ය වන ද්‍රව්‍ය ආනයනය
    - ලොරි, ට්‍රක් රථ, බස් රථ, ක්‍රීඩා උපකරණ, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍රෝපකරණ, ඉරූ දැව, අච්කණ්නාඩි, සුවඳ විලවුන්, උදළු, මුල්ලු සහ අච්චු (ලෝහ, වීදුරු, රබර් සහ ප්ලාස්ටික්), කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදනය සඳහා අවශ්‍ය උපකරණ හා උපාංග, ආලෝක සංවේදී අර්ධ සන්නායක උපකරණ සහ ඇස් කණ්නාඩි හා ඇස් කණ්නාඩි රාමු නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ආනයනය හෝ සැපයුම්

2012 ජනවාරි 13 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා මාස හතරක කාලයකට ක්‍රියාත්මක වන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වැඩිකිරීම හෝ හඳුන්වාදීම සිදු කරන ලදී.

| අයිතමය | පැවති බදු අනුපාතය | සංශෝධිත බදු අනුපාතය |
|---|---|---|
| සීනි | කි.ග්‍රෑ 1 ට රුපියල් 05 | කි.ග්‍රෑ 1 ට රුපියල් 10 |
| මයිසූර් පරිප්පු - පියළි නොකළ | " 10 | " 18 |
| මයිසූර් පරිප්පු - පියළි කළ | " 15 | " 22 |
| සුදු ඵෑණු | " 25 | " 40 |
| මෑ වර්ගයේ ඇට - පියළි නොකළ | " 10 | " 15 |
| මෑ වර්ගයේ ඇට - පියළි කළ | " 15 | " 20 |
| අලුත් හෝ ශීතකළ මසුන් සහ හිමායිත මසුන් | - | මි. ර. ගැ. වලින් 30% හෝ කි. ග්‍රෑ. 1ට රු. 35 යන අගයන් දෙකෙන් ඉහළ අගය |
| සෝයා බෝංචි තෙල්, පාම් තෙල්, සූරියකාන්ත තෙල් - පිරිසිදු නොකළ | - | කි.ග්‍රෑ 1 ට රුපියල් 65 |
| සෝයා බෝංචි තෙල්, පාම් තෙල්, සූරියකාන්ත තෙල් සහ පොල් තෙල් | - | " 75 |

2012 පෙබරවාරි 13 - පෙට්‍රල් සහ ඩීසල් ආනයනයේ දී ලබා දී තිබූ සම්පූර්ණ තීරු බදු අත්හැරීම පිළිවෙලින් ලීටරයට රුපියල් 35 සිට ලීටරයට රුපියල් 23 දක්වා හා ලීටරයට රුපියල් 15 සිට ලීටරයට රුපියල් 13 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, පෙට්‍රල් සහ ඩීසල් සඳහා අදාළ වන තීරු බදු අනුපාත ලීටරයට රුපියල් 12ක් සහ ලීටරයට රුපියල් 2කි.

2012 මාර්තු 02 - අර්තාපල් ආනයනය සඳහා අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා වැඩිකරන ලදී.

2012 මාර්තු 22 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා අය කරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස නමයක කාලයකට අදාළ වන පරිදි වැඩි කරන ලදී.

| අයිතමය | පැවති බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) | සංශෝධිත බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) |
|---|---|---|
| මුං ඇට | රුපියල් 50 | රුපියල් 75 |
| පැඟිරි වර්ගයේ පලතුරු | " 35 | " 50 |
| කුරක්කන් | " 75 | " 100 |

2012 මාර්තු 31 - ආනයනික මෝටර් රථ වාහන උපාංග, අමතර කොටස් සහ මෝටර් රථ බඳ කොටස් සඳහා තීරු බදු අනුපාතය ඒකක අගය හෝ ප්‍රතිශත අගය යන දෙකෙන් ඉහළ අගය ලෙස වෙනස් කරන ලදී.

- සං.ව.ශීර්ෂ 87.03 සහ 87.02 යටතේ ආනයනය කළ හැකි මෝටර් රථවල (බස් රථ හැර) යෝග්‍ය කාලසීමාව අවුරුද්දක් දක්වා ද, සං.ව. ශීර්ෂ 87.04 යටතේ ආනයනය කළහැකි මෝටර් රථවල යෝග්‍ය කාලසීමාව අවුරුදු තුනහමාරක් දක්වා ද සංශෝධනය කරන ලදී.

2012 අප්‍රේල් 10 - වියළි හාල්මැස්සන්, රතු ළූණු, ලොකු ළූණු, මෑ වර්ගයේ ඇට, මිරිස් සහ ටින් මාළු ආනයනය සඳහා අයකළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා අදාළ වන පරිදි දීර්ඝ කරන ලදී.

2012 මැයි 04 - කිරිපිටි ආනයනයේ දී වටිනාකම මත සියයට 15 ක හෝ කිලෝග්‍රෑමයට රුපියල් 33 ක තීරුබදු අතහැරීමක් ලබාදෙන ලදී. ඒ අනුව, අදාළ බදු ප්‍රමාණය සියයට 15 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 92 ක් වේ.

2012 මැයි 12 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමේ දී අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස නමයක කාලයක් සඳහා අදාළ වන පරිදි වැඩි කරන ලදී.

| අයිතමය | පැවති බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) | | සංශෝධිත බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) | |
|---|---|---|---|---|
| ලොකු ළූණු | රුපියල් | 25 | රුපියල් | 35 |
| මෑ වර්ගයේ ඇට - පියළි නොකළ | " | 15 | " | 20 |
| මෑ වර්ගයේ ඇට - පියළි කළ | " | 20 | " | 25 |
| මුං ඇට | " | 75 | " | 100 |
| කුඩු නොකළ සහ නොඇඹරූ මිරිස් | " | 20 | " | 25 |
| මෙනේරි | " | 75 | " | 100 |
| සෝයා බෝංචි තෙල්, පාම් තෙල්, සූරියකාන්ත තෙල් - පිරිසිදු නොකළ | " | 65 | " | 80 |
| සෝයා බෝංචි තෙල්, පාම් තෙල්, සූරියකාන්ත තෙල් සහ පොල් තෙල් | " | 75 | " | 90 |

- සං.ව. සංකේත 0805.20.10 යටතේ ආනයනය කරන ලද පැඟිරි වර්ගයේ පළතුරු සඳහා පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉවත් කර ඒ සඳහා කලින් පැවති තීරු බදු සහ අනෙකුත් බදු වර්ග නැවත හඳුන්වා දෙන ලදී.

2012 ජූනි 20 - සීනි ආනයනය සඳහා අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා වැඩි කරන ලදී.

2012 ජූනි 28 - එළවළු වර්ග, කල්තබා ගතහැකි ලෙස සැකසූ සුදු ළූණු, ළූණු, පැඟිරි වර්ගයේ අලුත් පළතුරු සහ තිරිඟු පිටි ආනයනය කිරීමේ දී අයකළ සෙස් බද්ද වැඩි කරන ලදී.

- යකඩ හෝ මිශ්‍ර ලෝහ වානේවලින් කළා වූ දඬු හා පොලු, කම්බි, නළ සහ පයිප්ප ආනයනය සඳහා සෙස් බද්ද පනවන ලදී.

2012 ජූලි 14 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා අය කරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස තුනක කාලයකට අදාළ වන පරිදි අඩු කරන ලදී.

| අයිතමය | පැවති බදු අනුපාතය | සංශෝධිත බදු අනුපාතය |
|---|---|---|
| අළුත් හෝ ශීතකළ මසුන් සහ හිමායිත මසුන් | මි. ර. ගැ. වලින් 30% හෝ කි. ග්‍රෑ. 1 ට රු. 35 යන අගයන් දෙකෙන් ඉහළ අගය | මි. ර. ගැ. වලින් 10% හෝ කි. ග්‍රෑ. 1 ට රු. 10 යන අගයන් දෙකෙන් ඉහළ අගය |
| වියළි හාල්මැස්සන් | කි.ග්‍රෑ. 1 ට රුපියල් 30 | කි.ග්‍රෑ. 1 ට රුපියල් 10 |
| අර්තාපල් | " 30 | " 10 |
| කරවල | " 100 | " 75 |
| ලොකු ළූණු | " 35 | " 25 |
| ටින් මාළු | " 85 | " 50 |

2012 අගෝස්තු 13 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා අය කරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයකට අදාළ වන පරිදි වැඩිකරන ලදී.

| අයිතමය | පැවති බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) | සංශෝධිත බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) |
|---|---|---|
| ලොකු ළූණු | රුපියල් 25 | රුපියල් 50 |
| අර්තාපල් | " 10 | " 30 |

2012 සැප්තැම්බර් 03 - කල්තබා ගත හැකි ලෙස සැකසූ සුදුළූණු, යකඩ හෝ මිශ්‍ර ලෝහ වානේවලින් කළා වූ දඬු සහ පොලු ආනයනය සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.

- පිඟන් මැටිවලින් සාදන සියළුම භාණ්ඩ ආනයනය සඳහා අය කරන සෙස් බද්ද වැඩිකරන ලදී.

2012 සැප්තැම්බර් 18 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා අය කරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස තුනක කාලයකට අදාළ වන පරිදි වැඩිකරන ලදී.

| අයිතමය | පැවති බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) | සංශෝධිත බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) |
|---|---|---|
| අර්තාපල් | රුපියල් 30 | රුපියල් 50 |
| ටින් මාළු | " 50 | " 75 |

2012 නොවැම්බර් 09 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා අය කරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයකට අදාළ වන පරිදි වැඩිකිරීම හෝ හඳුන්වාදීම සිදුකරන ලදී.

| අයිතමය | පැවති බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) | සංශෝධිත බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) |
|---|---|---|
| උම්බලකඩ | රුපියල් 250 | රුපියල් 275 |
| උඳු | " 100 | " 110 |
| මිදි - අළුත් | " 120 | " 130 |
| මිරිස් - කුඩු කළ හෝ ඇඹරූ | " 40 | " 150 |
| මිරිස් - වෙනත් | - | " 150 |
| කොත්තමල්ලි - කුඩු කළ හෝ ඇඹරූ | රුපියල් 90 | " 200 |
| සූදුරු බීජ | " 150 | " 160 |
| කහ - අනෙකුත් | " 300 | " 500 |
| රට කජු - පොතු හරින ලද | " 100 | " 110 |
| අබ ඇට | " 50 | " 60 |
| සෝයා බෝංචි තෙල්, පාම් තෙල්, සූරියකාන්ත තෙල් සහ පොල් තෙල් | " 90 | " 110 |
| ටින් මාළු | " 75 | " 100 |

- කිරිපිටි ආනයනය සඳහා ලබාදුන් තීරු බදු අත්හැරීම සියයට 15 හෝ කිලෝ ග්‍රෑමයට රුපියල් 18 ක් දක්වා අඩු කරන ලදී. ඒ අනුව, බලපවත්නා තීරු බදු අනුපාතය සියයට 15 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 107 කි.
- බඩඉරිඟු පිෂ්ඨය, කඩදාසි පල්ප අච්චු හෝ තෙරපීමෙන් නිෂ්පාදිත භාණ්ඩ සහ මුද්‍රණ හෝ ග්‍රැෆික් කටයුතු සඳහා භාවිතා වන ආලේපිත කඩදාසි ආනයනය සඳහා තීරු බදු අඩු කරන ලදී.
- යකඩ හෝ වානේවලින් නිම කළ නිර්මාණ හා නිර්මාණ කොටස්, මෝල්ට්වලින් නිෂ්පාදනය කළ බීර, ස්ප්‍රිතු, ආසුත වයින් හෝ මිදි පෙරීමෙන් ලබාගන්නා ස්ප්‍රිතු වර්ග, විස්කි, රම්, ජින් හා ජිනීවා, වොඩ්කා, ලිකර් සහ කෝඩියල් ආනයනය සඳහා වූ තීරු බද්ද වැඩි කරන ලදී.
- රබර්වලින් නිම වූ වායු ටයර්, තෙත් පිහනකඩ සහ ගොඩනැගිලි ඇතුළත සූර්යාලෝකය අවශෝෂණය සහ විසුරුවන දිවා ආලෝක උපකරණ ආනයනය සඳහා තීරු බද්ද හඳුන්වා දෙන ලදී.
- ජල භාවිතය අවම සනීපාරක්ෂක භාණ්ඩ වීදුරු පබළු සහ පොලියෙස්ටර් රෙසින ආනයන තීරු බද්දෙන් නිදහස් කරන ලදී.
- සූර්ය බලශක්ති ඒකක, උපාංග හෝ සූර්ය බලශක්ති ගෘහස්ථ පද්ධති, නොමිලේ සෞඛ්‍ය සේවා සපයන ආයතනයකට පරිත්‍යාග කිරීම සඳහා වන වෛද්‍ය උපකරණ සහ ගල් අඟුරු ආනයනය වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.
- රෙදිපිළි සහ ඇඟළුම් කර්මාන්තයට යොදාගන්නා යෙදවුම් ආනයනය මත වන වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද සියයට 2.5 දක්වා අඩු කරන ලදී.
- කුරුඳු, කරාබුනැටි, ස්වභාවික වැලි, තිරුවානා, මැටි, පොස්පේට්, ගල් (Emery, Corundum, Gravel,Pebbles), තලාතු මිනිරන්, ස්ටීටයිට්, අනෙකුත් ඛනිජ, ඉල්මනයිට්, රූටයිල්, ටයිටේනියම්, සර්කෝනියම්, නයෝබියම්, ටැන්ටලම් සහ වැනේඩියම් අපනයනය සඳහා වන සෙස් බද්ද වැඩිකරන ලදී.
- බඩඉරිඟුවලින් නිෂ්පාදිත පොතු හරින ලද හා අඹරන ලද ධාන්‍ය, ස්වභාවික පැණි ආනයනය සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.
- ජල භාවිතය අවම සනීපාරක්ෂක උපකරණ සහ ගෝනි නූල්වලින් වියන ලද රෙදි වර්ග ආනයනය සඳහා සෙස් බද්ද අඩු කරන ලදී.
- ටැක්සි මීටර්, රේඩියේටර් සහ කොටස්, ඇලුමිනියම් වයර්, ගෝස් සහ වෙළුම් පටි, තෙත් පිහනකඩ, පොටි, ලිහිසි ද්‍රව්‍ය සහ පැණි හා හකුරු ආනයන මත සෙස් බදු පනවන ලදී.
- කිරි නිෂ්පාදන, කුරුළු බිත්තර, සත්ව මූලමය ආහාරයට ගන්නා නිෂ්පාදන, කැපූ මල්, මල් කැකුළු, කොළ අතු, අළුත්/කල් තබා ගැනීමට පිළියෙළ කළ/වියළි එළවළු සහ පළතුරු, අනෙකුත් එළවළු සහ පළතුරු නිෂ්පාදන, ආහාරයට ගන්නා තෙල්, මාගරින්, ලිංගුස් සහ කල් තබා ගැනීමට පිළියෙළ කළ නිෂ්පාදන, රස කැවිලි, බේකරි නිෂ්පාදන, සකස් කළ ආහාර, ඛනිජ ජලය, විනාකිරි, ලුණු, සබන්, මැලියම් වර්ග, දත් බුරුසු සඳහා මිට, මෝටර් රථ සහ සැහැල්ලු ට්‍රක් රථ සඳහා ටයර්, සබන් දවටන, රෙදි වර්ග, වානේ සහ පෙර සවි ගොඩනැගිලි ආනයනය සඳහා සෙස් බදු වැඩි කරන ලදී.
- රේසින් කාර් යටතේ වර්ග කරන ලද 'ගෝ කාර්ට්ස්' ආනයනය නිෂ්පාදන බද්දෙන් නිදහස් කරන ලදී.
- ත්‍රි රෝද රථ, මෝටර් රථ (එන්ජින් ධාරිතාව 1,000 ට අඩු), ට්‍රක් රථ, තනි කැබ් රථ, ආසුත ජලය, පයිප්ප දුම් කොළ සහ අවමංගල රථ සඳහා වූ නිෂ්පාදන බදු වැඩි කරන ලදී.

2012 දෙසැම්බර් 08 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස දෙකක කාලයක් සඳහා අඩු කරන ලදී.

| අයිතමය | පැවති බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) | සංශෝධිත බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) |
|---|---|---|
| අර්තාපල් | රුපියල් 50 | රුපියල් 15 |
| රතු ළූණු | " 25 | " 15 |
| ලොකු ළූණු | " 50 | " 15 |

2013 ජනවාරි 01 - බුල්ඩෝසර්, ග්‍රේඩර්ස්, ලෙවලර්ස්, එක්ස්කැවේටර්ස්, බලශක්ති පිරිමසින බල්බ නිෂ්පාදනය සඳහා වන අමුද්‍රව්‍ය, අර්ධ ට්‍රේලර සඳහා වන රෝඩ් ට්‍රැක්ටර්, බවුසර, ගිනි නිවන රථ ආනයනය එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- සූර්ය බලශක්ති උත්පාදනය සඳහා වන සූර්ය (බලශක්ති) ඒකක, උපාංග හෝ සූර්ය බලශක්ති උත්පාදනය සඳහා පවතින ගෘහස්ථ පද්ධති, ගල් අඟුරු, මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඕනෑම ජාත්‍යන්තර ක්‍රීඩාවකට සම්බන්ධ භාණ්ඩ සහ ඔප දමා සකස් කරන ලද මැණික් ලෙසට පසුව විකුණනු ලබන විශේෂ සේවා ගාස්තුවට යටත් වන මැණික් ආනයනය සඳහා වූ ජාතිය ගොඩනැගීමේ බද්ද නිදහස් කරන ලදී.
- කිසිදු ඔප දමා සකස් කිරීමක් නොමැතිව දේශීය වශයෙන් මැණික් අලෙවිය ජාතිය ගොඩනැගීමේ බද්දට (පිරිවැටුම් බද්ද වෙනුවට පනවන ලද) යටත් කරන ලදී.

2013 පෙබරවාරි 08 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයකට අදාල වන පරිදි හඳුන්වාදෙන ලදී.

| අයිතමය | | නව බදු අනුපාතය (කිලෝග්‍රෑමයට) |
|---|---|---|
| පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් : | | |
| | පිරිසිදු නොකළ තෙල් | රුපියල් 110 |
| | අනෙකුත් | " 115 |

**විදේශ විනිමය කළමනාකරණය**

2012 මාර්තු 01 - බලයලත් වෙළෙඳුන් තම ගණුදෙනුකරුවන් සමග ඇතිකරගනු ලබන විදේශ විනිමය ඉදිරි ගිවිසුම්වල දී ඊට අදාළව විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලැබූ විචක්ෂණශීලී අවශ්‍යතාවයන්ට අනුකූල වියයුතු බව දන්වමින් බලයලත් වෙළෙඳුන්හට නව මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2012 ජූනි 01 - විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් හෝ වෙනත් එවැනි ගෙවීම් මාධ්‍යයක් හරහා විදේශ විනිමය වෙළෙඳාම පිණිස සිදුකරනු ලබන ගෙවීම් සඳහා අවසර ලබා නොදිය යුතු බවට ද එවන් ගෙවීම් වළක්වා ගැනීම සඳහා සුපරීක්ෂාකාරී විය යුතු බව ද දන්වමින් බලයලත් වෙළෙඳුන් හට මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2012 ජූනි 19 - විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාව තුළ ඕනෑම අරමුණක් සඳහා භාවිතා කිරීම පිණිස යම් කොන්දේසි හා නියමයන්ට යටත්ව ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ලබාදීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙන ලදී.

2012 ජූලි 11 - අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC) අතර, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC) අතර සහ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට වඩාත් නම්‍යශීලී අයුරින් අරමුදල් මාරු කිරීමට අවසර ලබා දෙමින් අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් නව මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

| | |
|---|---|
| | - විදේශ විනිමය උපයන්නන් විසින් පවත්වාගෙන යනු ලබන විවිධ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් කිහිපයක් ඒකාබද්ධ කරමින් "විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම" (FEEA) නමින් නව විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හඳුන්වා දෙන ලදී. |
| 2012 සැප්තැම්බර් 07 | - ශ්‍රී ලංකා ව්‍යවහාර මුදල් අපනයනය සහ ආනයනය සම්බන්ධයෙන් අදාළ වන රෙගුලාසි සංශෝධනය කරන ලද අතර ඒ අනුව එක් අයෙකුට රුපියල් 5,000 වූ සීමාව රුපියල් 20,000 දක්වා ඉහළ නංවන ලදී. |
| 2012 ඔක්තෝබර් 02 | - අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගය සඳහා බලයලත් විදේශ විනිමය හුවමාරු කරන්නන් හට පිරිනමන ලද උපරිම විදේශ විනිමය අනුපාතය දෛනික පදනමක් මත සෑම වැඩ කරන දිනයකදීම දැනුම් දියයුතු බවට බලයලත් වෙළෙඳුන්හට දැනුම් දෙන ලදී. |
| 2012 නොවැම්බර් 29 | - විවිධ ඇපකර වර්ග හයක් හඳුන්වා දෙමින් බැංකු ඇපකර නිකුත් කිරීම හා අලුත් කිරීම සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් හට නිකුත් කරන ලද විධානයන් නිකුත් කරන ලදී. |
| 2012 දෙසැම්බර් 20 | - ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට විදේශ ව්‍යවහාර මුදල්වලින් ගෙවීම් කිරීමේ දී විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් භාවිතා කිරීමට අදාළ කොන්දේසි හා නියමයන් සඳහන් කරමින් නව ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. |
| 2012 දෙසැම්බර් 31 | - එතෙර සේවා නියුක්ත පුද්ගලයින්ගේ ඉපැයීම් පහසුවෙන් සහ ලාභදායීව ප්‍රේෂණය කිරීමේ පියවරක් වශයෙන් "ආමුඛ ප්‍රේෂණ බෙදා හැරීමේ ගිණුම" (IRDA) නමින් නව ගිණුමක් හඳුන්වා දුන් අතර, මුහුදු යාත්‍රා/නැව්, වාණිජ ගුවන් යානා ආදියට සේවා සපයනු ලබන පුද්ගලයන්ගේ සහ විදේශ රටවලදී ඉදිකිරීම්, පවිත්‍රතා, සෞඛ්‍ය, ආරක්ෂක, ගිණුම්කරණ, නෛතික හා වෙනත් සේවා සපයනු ලබන පුද්ගලයන්ගේ ඉපැයීම් බෙදාහැරීම සඳහා නිෂ්කාශන ගිණුමක් ලෙස මෙම ගිණුම භාවිතා කළ හැක. |
| 2013 ජනවාරි 01 | - අනේවාසිකයන් විසින් ශ්‍රී ලංකාව තුළ කරනු ලබන ආයෝජන සහ ගනුදෙනු හා සම්බන්ධ යාන්ත්‍රණය සරල කිරීම පිණිස, බලයලත් වෙළෙඳුන් හට "සුරැකුම්පත් ආයෝජන ගිණුම" (SIA) පිළිබඳ නව විධානයන් නිකුත් කරන ලදී. දැනට පවතින සියලුම "අනේවාසික ශ්‍රී ලාංකික ආයෝජන සඳහා වන රුපියල් ගිණුම්" (RANSI), "සුරැකුම්පත් ආයෝජන ගිණුම" ලෙස නැවත නම් කළයුතු බව බලයලත් වෙළෙඳුන් හට තවදුරටත් උපදෙස් දෙන ලදී. |
| | - විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් ජංගම, ඉතුරුම් හෝ කාලීන තැන්පතු ආකාරයෙන් ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් විවෘත කළහැකි බව බලයලත් වෙළෙඳුන් හට දැනුම් දෙන ලදී. |
| | - විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය (ECBS) යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගෙන් ණය ලබා ගැනීම සඳහා යම් යම් කොන්දේසිවලට යටත්ව පොදු අවසරයක් ප්‍රදානය කරන ලදී. |
| | - ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකු හට සපයන ලද භාණ්ඩ හා සේවාවලට අදාළ ගෙවීම් විදේශ ව්‍යවහාර මුදලින් භාර ගැනීම සඳහා පොදු අවසරයක් ප්‍රදානය කරන ලදී. |
| 2013 ජනවාරි 02 | - බලයලත් වෙළෙඳුන් විසින් ඔවුන්ගේ පාරිභෝගිකයන් සමග ඇති කර ගනු ලබන ඉදිරි වෙළෙඳ ගිවිසුම් හා සම්බන්ධ කාලසීමා නියමයන් සංශෝධනය කරන ලදී. |
| | - සුරැකුම්පත් ආයෝජන ගිණුමකින් එම ගිණුම් හිමියාගේම අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක බැරට අරමුදල් මාරුකිරීම සඳහා අවසර ලබාදෙන ලදී. |
| | - සුරැකුම්පත් ආයෝජන ගිණුමකින් එම ගිණුම් හිමියාගේම විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුමක (SFIDA) බැරට අරමුදල් මාරු කිරීම සඳහා අවසර ලබාදෙන ලදී. |

- සුරැකුම්පත් ආයෝජන ගිණුමකින් එම ගිණුම් හිමියාගේම නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (RNNFC) බැරට අරමුදල් මාරු කිරීම සඳහා අවසර ලබාදෙන ලදී.
- සුරැකුම්පත් ආයෝජන ගිණුමකින් එම ගිණුම් හිමියාගේම අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (NRNNFA) බැරට අරමුදල් මාරු කිරීම සඳහා අවසර ලබාදෙන ලදී.

2013 ජනවාරි 04 - ශ්‍රී ලංකා රුපියල්වලින් නියම කර ඇති ගෙවා නිදහස් කළ හැකි වරණීය කොටස් අනුමත කළ රටක අරමුදල්වලට, අනුමත කළ ප්‍රාදේශීය අරමුදල්වලට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සංස්ථාපිත ආයතනවලට සහ ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන්ට නිකුත් කිරීම සහ පැවරීම සඳහා නිශ්චිත කොන්දේසිවලට යටත්ව පොදු අවසරයක් ප්‍රදානය කරන ලදී.

2013 ජනවාරි 23 - “ආමුඛ ආයෝජන ගිණුම” (IIA) සම්බන්ධයෙන් නිකුත් කරන ලද විධානය අවලංගු කරන ලදී.

2013 ජනවාරි 24 - විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගෙන ඇති සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ගේ නමින් විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් විවෘත කළහැකි බවට බලය ලත් වෙළෙඳුන්හට දැනුම් දෙන ලදී.

2013 ජනවාරි 30 - අනේවාසික ශ්‍රී ලාංකිකයන්ට හිමි, ශ්‍රී ලංකාව තුළ පිහිටි දේපළ මිලදී ගැනීමේදී එම ප්‍රතිශ්ඨාව ශ්‍රී ලංකා මුදලින් අනේවාසික ශ්‍රී ලාංකිකයන්ට ගෙවීමට ශ්‍රී ලාංකිකයන්ට ලබාදී තිබූ අවසරය සහ ශ්‍රී ලංකාවේ පිහිටි තමන්ට හිමි දේපළ විකුණන අනේවාසික ශ්‍රී ලාංකිකයන්ගේ නමින් අනේවාසික සංවෘත ගිණුම් ආරම්භ කිරීම සඳහා බලයලත් වෙළෙඳුන්හට ලබාදී තිබූ අවසරය ශ්‍රී ලාංකික සම්භවයක් ඇති අනේවාසික පුද්ගලයන් දක්වා දීර්ඝ කරන ලදී.

2013 ජනවාරි 31 - ඒකක භාරයක ඒකක විදේශීය ආයතනික ආයෝජකයන්ට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සමාගම්වලට සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන්ට නිකුත් කිරීමට සහ පැවරීමට නිශ්චිත කොන්දේසිවලට යටත්ව පොදු අවසරයක් ප්‍රදානය කරන ලදී.

**අපේක්ෂිත**

- නේවාසිකයන් විසින් සිදුකරනු ලබන විදේශ ආයෝජනවලට අදාළ වත්මන් සීමාව ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලබන, නේවාසිකයන්ගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා අනේවාසිකයන්ගේ දේශීය මුදලින් පවත්වාගෙන යනු ලබන ආයෝජන ගිණුම් ප්‍රවර්ධනය කිරීම.
- විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ව්‍යාපාරයේ නියැලීම සඳහා බැංකු නොවන ඒකකවලට අවසර ලබාදීම පිණිස නිර්ණායකයක් හඳුන්වා දීම.
- විදේශ සමාගම්වල කොටස් ශ්‍රී ලංකාවේ ද, ශ්‍රී ලංකාවේ සමාගම්වල කොටස් විදේශ හුවමාරුවල ද ලැයිස්තුගත කිරීම.
- ජංගම දුරකථන හරහා ආමුඛ ප්‍රේෂණ සිදුකිරීමට පහසුකම් සැලසීම.
- වාණිජ බැංකුවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා විදේශ ව්‍යවහාර මුදල් මාරුකිරීම ප්‍රවර්ධනය කිරීම.
- නැව් සමාගම්, තොටුපොළ මෙහෙයුම් හා වරාය සේවා අතර අරමුදල් මාරු කිරීම සඳහා පහසුකම් සැලසීම.
- විගාමිකයන් ගේ ආදායම් ප්‍රේෂණය කිරීම සඳහා නව ප්‍රතිපත්තිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම.
- අනේවාසිකයන් සමග සිදු කරනු ලබන ව්‍යාපාරික ගනුදෙනුවලදී විදේශ ව්‍යවහාර මුදල් භාර ගැනීම සඳහා පොදු අවසරයක් ප්‍රදානය කිරීම.

## රාජ්‍ය මූල්‍ය අංශය

**රාජ්‍ය ආදායම**

2012 ජනවාරි 01

- පහත දැක්වෙන අයිතමයන් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
  - ජල විදුලි බල උත්පාදනය සඳහා යොදා ගනු ලබන දේශීයව නිෂ්පාදිත යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, සංචාරක හෝටල් සහ ගුවන් සේවා සඳහා අවශ්‍ය වන දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදිත භාණ්ඩ, ටින් මාළු, ටර්බයින, හඳුනාගත් රාජ්‍ය ආයතනයන්ට අවශ්‍ය ආනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවට ආදේශනය කරනු ලබන දේශීයව නිෂ්පාදිත භාණ්ඩ සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන
  - පර්යේෂණ හා සංවර්ධන සේවා, වාණිජ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන් සහ චිත්‍ර ශිල්පීන්ගේ චිත්‍ර නිර්මාණ සැපයීම
  - ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදල් සඳහා පොලී, ලාභාංශ හෝ ණය උපකරණ ගනුදෙනු මගින් ලැබෙන එකතු කළ අගය
- අපනයනකරුවන් සඳහා භාණ්ඩ තොග සහ සිල්ලරට විකිණීම, නැවුම් කිරි, අමු තේ දළු, කුරුඳු, රබර් (ලේටෙක්ස්, ක්‍රේප් හෝ ෂීට් රබර්), පිරවුම්හලක විකුණන පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල්, දේශීයව නිෂ්පාදනය කළ මැටි උළු කැට සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන එම නිෂ්පාදකයා විසින් විකිණීම, චිත්‍ර ශිල්පියකු විසින් තම චිත්‍ර විකිණීම ආදිය ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.
- ලබාගන්නා ජාත්‍යන්තර ඇමතුම් සඳහා ජාත්‍යන්තර ක්‍රියාකරු විදුලි සංදේශ බද්ද මිනිත්තුවකට රුපියල් 2 සිට රුපියල් 3 දක්වා ඉහළ දමන ලදී.
- ලැබෙන ජාත්‍යන්තර ඇමතුම් සඳහා ජාත්‍යන්තර ක්‍රියාකරු විදුලි සංදේශ බද්ද මිනිත්තුවකට එ.ජ. ඩොලර් 0.07 සිට එ.ජ. ඩොලර් 0.09 දක්වා ඉහළ දමන ලදී.

2012 මාර්තු 31

- මෝටර් රථ, ත්‍රී රෝද රථ සහ යතුරු පැදි ආනයනය සඳහා නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී.
- සැර මධ්‍යසාර සහ මෝල්ට් මධ්‍යසාර සඳහා සුරා බදු පිළිවෙළින් සම්මත මධ්‍යසාර ලීටරයකට රුපියල් 60 කින් සහ තොග ලීටරයකට රුපියල් 5 කින් වැඩි කරන ලදී.
- දුම්වැටිවල දිග මත පදනම්ව පනවා තිබූ නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී.

2012 අප්‍රේල් 01

- ව්‍යාපාරයේ පරිමාණය සහ ආයෝජනයේ ප්‍රමාණය අනුව කෘෂිකාර්මික සහ කෘෂි සැකසුම්, සත්ත්ව පාලනය හා සැකසුම්, ධීවර හා ධීවර සැකසුම්, තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර හෝ දැනුම් ක්‍රියාදාමයන් බාහිරින් ලබා ගැනීම, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, රූපලාවන්‍ය කටයුතු, ශීත කාමර සහ ගබඩා පහසුකම්, සංචාරක කර්මාන්තය, කලා කටයුතු ඇතුළු නිර්මාණශීලී කටයුතු, ක්‍රීඩා සහ ශරීර සුවතා මධ්‍යස්ථාන යන ඕනෑම ක්‍රියාකාරකමක නිරත වන නව ව්‍යවසායයන් සඳහා ද නිපැයුම් නිෂ්පාදන සඳහා දැනට ලබා දී තිබෙන ආදායම් බදු නිදහස් කිරීම් ලබාදෙන ලදී.
- පවතින ව්‍යාපාරයක් පුළුල් කිරීම සඳහා 2015 මාර්තු මස 31 වන දිනට පෙර රුපියල් මිලියන 50 ට අඩු නොවන ආයෝජනයක් සිදු කරන්නේ නම් එම ආයෝජනය කළ මුදල එසේ අයෝජනය කළ වර්ෂයේ සිට ආරම්භ වන වර්ෂ හතරක කාලපරිච්ඡේදය තුළ එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආයෝජන මුදලින් සියයට 25 ක උපරිමයකට යටත්ව තක්සේරු ආදායමෙන් අඩු කිරීමට අවසර දෙන ලදී.
- සිමෙන්ති, ඖෂධ, රෙදිපිළි සහ කිරිපිටි නිෂ්පාදනය සඳහා සිදුකරනු ලබන ආයෝජනය වෙනුවෙන් නව ව්‍යාපාරයකට වසර 5 ක බදු විරාමයක් හා ඉක්බිතිව සහනදායී ආදායම් බදු අනුපාතයක් ද, පවත්නා ව්‍යාපාරයක් සඳහා වසර 5 ක සහනදායි ආදායම් බදු අනුපාතයක් සහ සුදුසුකම් ලබන ගෙවීම් සහනයන් ලබා දෙන ලදී.

- ව්‍යාපාරයක් විසින් පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ ආනයනය මත ගෙවන එකතු කළ අගය මත බද්ද, තීරු බද්ද, සෙස් බද්ද හා වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද යන බදු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාල පරිච්ඡේදය තුළ විලම්භනය කිරීමට අවසර දෙන ලදී.
- ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සහ ළමා ආරක්ෂණ අධිකාරියේ ලාභ සහ ආදායම් (ලාභාංශ හා පොලී ආදායම් නොවන) ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- ශ්‍රී ලංකාවෙන් පිටත රටකින් ලැබෙන රාජ්‍ය භාග, බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන්නේ නම් එකී රාජ්‍ය භාග ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදලක ඒකක නිදහස් කර ගැනීමෙන් උද්ගතවන ලාභ සහ ආදායම්, ශ්‍රී ලංකාවේ පුද්ගලයෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට ණය දීමෙන් ශ්‍රී ලංකාවෙන් පිටත යම් පුද්ගලයෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට උපචිත වන
- පොලී, ක්‍රීඩාංගන, ක්‍රීඩාගාර හෝ ක්‍රීඩා සංකීර්ණ පරිපාලනයෙන් උද්ගත වන ලාභ හා ආදායම් සහ ශ්‍රී ලංකාවට ගෙන්වන ලද ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන ක්‍රීඩා පුහුණුකරුවෙකු එම සේවය සඳහා ලබන ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- සංවර්ධන බැංකු කටයුතු සඳහාම වෙන්වූ අලුතින් පිහිට වූ වාණිජ බැංකු ශාඛාවක ලාභ සහ ආදායම් සියයට 24 ක් වන අඩු ආදායම් බදු අනුපාතයකට යටත් කරන ලදී.
- පර්යේෂණ හා වැඩි දියුණු කිරීමේ කටයුත්තක නිරත වීමෙන් ලබන ලාභ සහ ආදායම් මත බදු අනුපාතය සමාගමක් නොවන පුද්ගලයෙකු සම්බන්ධයෙන් සියයට 16 ක උපරිමයකටත් සමාගමක් සම්බන්ධයෙන් සියයට 20 කටත් අඩු කරන ලදී.
- ශ්‍රී ලාංකික වෙළෙඳ නාමයකින් අගය වැඩි කිරීමක් සහිතව පිරිසිදු ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) අපනයන කිරීම සඳහා අපනයනකරුවෙකු සමඟ බද්ධ ව්‍යාපාරයක් ස්ථාපනය කර ඇති, තේ වවන්නකු හෝ තේ නිෂ්පාදකයකු එකී බද්ධ ව්‍යාපාරය සඳහා මිලදී ගත් තේ ප්‍රමාණයට ආරෝපණය කළ හැකි නිෂ්පාදන ආදායම් ප්‍රමාණය සඳහා සියයට 12 වන බදු අනුපාතය ලබාදෙන ලදී.
- දේශීය අත් යන්ත්‍ර රෙදි නිෂ්පාදනයේ නිරත පුද්ගලයකුගේ හෝ හවුල් ව්‍යාපාරයක ලාභ සහ ආදායම් මත වන උපරිම බදු අනුපාතය සියයට 12 කට අඩු කරන ලදී.
- සෞඛ්‍ය සේවාවලින් ලබන ලාභ සහ ආදායම් සඳහා උපරිම බදු අනුපාතය සියයට 12 කට අඩු කරන ලදී.
- තාක්ෂණයෙන් ඉහළ පිරියත, යන්ත්‍ර හෝ උපකරණ අත්පත් කර ගැනීමේ පිරිවැය, සේවා නියුක්තිකයෙකු විසින් පාවිච්චි කරනු ලබන මෝටර් වාහනයක් සම්බන්ධයෙන් සේවා යෝජකයෙකු විසින් දරන වියදම, මෝස්තර සංවර්ධනය, නිෂ්පාදන සංවර්ධනය සහ නව නිෂ්පාදන සොයා ගැනීම යන සේවා සැපයීම සම්බන්ධයෙන් දරන ප්‍රවාහන වියදම සහ යම් තැනැත්තෙකු විසින් ක්‍රීඩාංගන, ක්‍රීඩා මණ්ඩප හෝ ක්‍රීඩා සංකීර්ණ නඩත්තුව සඳහා දරන වියදම්, ලාභ සහ ආදායම් නිශ්චය කිරීමේදී අඩු කිරීමට අවසර ලබා දෙන ලදී.
- මැසීමට භාවිතා කරන නූල් සහ එළවළු කෙඳි ආශ්‍රිත නූල් හැර අනෙකුත් සියළු නූල් වර්ග සියලු බදු වලින් නිදහස් කරන ලදී.
- ලාභ මත ආදායම් බද්දට යටත් වන ඕනෑම ව්‍යාපාරයක පිරිවැටුම ආර්ථික සේවා ගාස්තු වලින් නිදහස් කිරීම මගින් ආර්ථික සේවා ගාස්තු අයකිරීමේ ක්‍රමය සරල කරන ලදී.
- දේශීයව නිෂ්පාදනය කළ මැටි උළු කැට සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදකයා විසින්ම විකිණීම, ආර්ථික සේවා ගාස්තු වලින් නිදහස් කරන ලදී.
- ආර්ථික සේවා ගාස්තු සඳහා බදු බැඳියාවෙන් නිදහස් සීමාව කාර්තුවකට රුපියල් මිලියන 25 සිට රුපියල් මිලියන 50 දක්වා වැඩි කරන ලදී.

2012 ඔක්තෝබර් 06

- සුරුට්ටු, දුම්වැටි, මධ්‍යසාර ස්ප්‍රීතු මත වන නිෂ්පාදන බදු/සුරා බදු වැඩි කරන ලදී.

2013 ජනවාරි 01

- පහත සඳහන් ආයතන මගින් කරනු ලබන සැපයීම් සහ පිරිවැටුම එකතු කළ අගය මත බද්දෙන් සහ ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.
  - ශ්‍රී ලංකා මහ බැංකුව (මූල්‍ය සේවා සැපයීම් මත එකතු කළ අගය මත බද්ද ඇතුළුව)
  - පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඒකාබද්ධ අරමුදලින් හෝ රජය හරහා ගනු ලැබූ ණය මුදලකින් හෝ රජය වෙනුවෙන් නොමිලේ සේවාවන් සලසන ඕනෑම රාජ්‍ය සංස්ථාවක්
- ඒකක භාර කළමණාකරන සමාගම් විසින් ඒකක භාරයන් වෙත කරනු ලබන සේවා සැපයීම්, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- ක්‍රීඩාවකට හෝ ක්‍රීඩාවක් සම්බන්ධ කටයුත්තකට සහභාගී වීම සඳහා ලංකාවට පැමිණෙන යම් ක්‍රීඩකයකුට, ක්‍රීඩා සංවිධායකුට හෝ අනුග්‍රාහකයකුට හෝටලයක නැවතීමේ පහසුකම් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- පොල් ආශ්‍රිත ඉවත ලන ද්‍රව්‍ය මගින් දේශීයව නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතයන් (කොහු බත්, කොහු කෙඳි, බීජ තවාන් මළු, වගා මළු, කොහු කඹ, පොල්ලෙලි) එකතු කල අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- තොග සහ සිල්ලර වෙළෙඳාම සඳහා එකතු කළ අගය මත බද්ද හඳුන්වා දෙන ලදී. ඒ අනුව කාර්තුවක් සඳහා රුපියල් මිලියන 500 ට වැඩි පිරිවැටුමක් සහිත (නිදහස් හෝ ඉවත් කරන ලද සැපයුම් ද සහිතව) තොග හෝ සිල්ලර වෙළඳමේ සහ සැපයුම්වල නිරත තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් එකතු කල අගය මත බද්ද සඳහා ලියාපදිංචි විය යුතු වේ. කෙසේ නමුත්, එකතු කළ අගය මත බද්ද අදාළ සැපයුම්වලට පමණක් වලංගු වේ.
- යම් තැනැත්තෙකු විසින් අන්තර් වෙළඳ ගිණුමකට (ස්ලැස් ගිණුමකට) හෝ එවැනි ගිණුමක සිට කොටස් පැවරීමේ නීතිමය සාධන පත්‍රයක් සඳහා මුද්දර ගාස්තුව ඉවත් කරන ලදී.
- පහත සඳහන් සාධන පත්‍ර සඳහා මුද්දර ගාස්තු වැඩි කරන ලදී.

| සාධන පත්‍ර | පැවති ගාස්තු | නව ගාස්තුව |
|---|---|---|
| දිවුරුම් පෙත්සම | රුපියල් 25 | රුපියල් 250 |
| රක්ෂණ ඔප්පුව | ඔප්පුව මත ගෙවිය යුතු වාරික වල එකතුව මත සෑම රුපියල් 1,000 ට හෝ ඉන් කොටසකට රුපියල් 0.50 බැගින් | ඔප්පුව මත ගෙවිය යුතු වාරික වල එකතුව මත සෑම රුපියල් 1,000 ට හෝ ඉන් කොටසකට රුපියල් 1 බැගින් |
| නොතාරිස් බලපත්‍රය | රුපියල් 1,000 | රුපියල් 2,000 |
| වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමට නිශ්චිත කාලයක් සඳහා දෙනු ලබන බලපත්‍රය | රුපියල් 1,000 හෝ බලපත්‍ර ගාස්තුවෙන් 10% යන දෙකින් අඩු අගය | රුපියල් 2,000 හෝ බලපත්‍ර ගාස්තුවෙන් 10% යන දෙකින් අඩු අගය |
| මද්‍යසාර විකිණීමේ ව්‍යාපාරයක් කරගෙන යාමට නිශ්චිත කාලයක් සඳහා දෙනු ලබන බලපත්‍රය | රුපියල් 10,000 | රුපියල් 20,000 |
| ණය කාඩ්පත් ගණුදෙනු පියවීම | සෑම රුපියල් 1,000 ට හෝ ඉන් කොටසක රුපියල් 10 බැගින් | සෑම රුපියල් 1,000 ට හෝ ඉන් කොටසක රුපියල් 15 බැගින් |

- ගුවන් තොටුපොළෙන් පිටවීමේ බද්ද එ.ජ.ඩොලර් 10 සිට එ. ජ. ඩොලර් 25 දක්වා සහ අන්තර්ජාලය හරහා වීසා ලබා ගැනීමේ ගාස්තුව එ. ජ. ඩොලර් 5 කින් වැඩි කරන ලදී.

- අධිවේගී අන්තර්ජාල පහසුකම් සඳහා දැනට පවතින විදුලි සංදේශ බද්ද සියයට 20 සිට සියයට 10 දක්වා අඩු කරන ලදී.
- ඔට්ටු සහ සූදු ව්‍යාපාරය සඳහා දැනට පවතින බදු ඉහළ දමන ලදී.
- අපනයනාභිමුඛ සමාගම් තම නිෂ්පාදන භාණ්ඩ දේශීය වෙළෙඳපොළේ අලෙවිකිරීමේ දී අයකරන බදු පහත පරිදි සංශෝධනය කරන ලදී.
  - නිමි ඇඳුම් හෝ පිඟන් භාණ්ඩ නිෂ්පාදනයේ යෙදෙන අපනයන සමාගමකට පිරිවැටුම මත අය කෙරෙන සියළුම වක්‍ර බදු වෙනුවට එකතු කල අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවීමට යටත්ව සිය දේශීය විකුණුම් සියයට 40 ක් දක්වා වැඩි කිරීමට අවසර ලබාදෙන ලදී.
  - එක් කොටසකට රුපියල් 25 බැගින් නිමි ඇඳුම් සඳහා වූ බද්ද ඉවත් කරන ලදී.
  - විකුණුම් වලින් ලැබෙන ලාභ සහ ආදායම් මත ආදායම් බද්ද (අපනයනයන් මෙන්ම දේශීය වෙළඳපොළෙහි විකිණුම් සඳහා) සියයට 12 ක සහනදායී බදු අනුපාතයක් කරන ලදී.
- යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කරගෙන යනු ලබන සියළු ව්‍යාපාර වල වාර්ෂික පිරිවැටුම/සැපයුම් රුපියල් මිලියන 12 නොඉක්මන විට, එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය එකතු කල අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද (තොග හෝ සිල්ලර ව්‍යාපාරයක ජාතිය ගොඩනැගීමේ බද්ද ඇතුලත්ව) සඳහා යටත් නොවනු ඇත.

**අපේක්ෂිත**

2013 අප්‍රේල් 01

- පහත දැක්වෙන ආයතනයන්හි ලාභ සහ ආදායම් (ලාභාංශ හා පොලී ආදායම් හැර) ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
  - කොලේජ් ඔෆ් ජෙනරල් ප්‍රැක්ටිෂනර්ස් ඔෆ් ශ්‍රී ලංකා (College of General Practitioners of Sri Lanka)
  - සමාජ ආරක්ෂණ මණ්ඩලය
  - ඒකාබද්ධ අරමුදලින් හෝ රජය විසින් සලස්වා දෙන ණය මුදලකින් ඕනෑම රාජ්‍ය සංස්ථාවක් විසින් නොමිලේ සපයනු ලබන සේවාවන්
  - ජාතික සංවර්ධන භාර අරමුදල සමඟ ඒකාබද්ධ කර ඇති ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව
- පහත සඳහන් ක්‍රියාකාරකම් තුළින් ලබන ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
  - එක් රටකින් ලබාගත් භාණ්ඩ ශ්‍රී ලංකාව හැර වෙනත් රටකට ප්‍රවාහනය කරන අක්වෙරළ ව්‍යාපාරයක
  - ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරකම් සඳහා අත්‍යාවශ්‍ය සහ ශ්‍රී ලංකාවේ දී ලබා ගත නොහැකි බවට තීරණය කරනු ලැබූ සේවාවක් වන්නේ නම් එ.ජ.ඩොලර් මිලියන 50 ක් ඉක්මවා ශ්‍රී ලංකාවෙන් පිටතින් ලබාගත් සෘජු විදේශීය ආයෝජන මඟින් කර ඇති විටදී, විදේශීය දායකයෙකු වෙත ගෙවනු ලබන රාජ්‍ය භාග, වරලත් නියෝජිත ගාස්තු හෝ මෝස්තර නිර්මාණය සඳහා කරන ලද ගෙවීම්.
  - අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි වූ සහ සමාගම් පනත යටතේ ස්ථාපනය නොකරන ලද රජයේ සහාය ලබන ඕනෑම පෞද්ගලික පාසලක
  - සාංගමික ණය සුරැකුම්පත් (කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කරන ලද) හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව නිකුත් කළ නාගරික බැඳුම්කර වල 2013 වසරේ ජනවාරි මාසයට පසු සිදුකරන ආයෝජන සඳහා ලැබෙන පොලී ආදායම.
  - ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ ලාභ සහ ආදායම් (ලාභාංශ සහ පොලී ආදායම් හැර)

- ආයෝජනය මුළුමනින්ම සෘජු විදේශීය ආයෝජන මඟින් එ. ජ. ඩොලර් මිලියන 50 ක් ඉක්මවා සිදුකරනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන සහ ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිත සමාගමක් විසින් බදු නිදහස් කාල සීමාව තුල ශ්‍රී ලංකාවට ගෙන්වන ලද විශේෂඥයෙකු වන පුද්ගලයෙකුගේ ශ්‍රී ලංකාව තුල දී උද්ගත වන පරිශ්‍රමික වලින් ලැබෙන ආදායම
- ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තෙකුගෙන් ලබාගත් ණයකින් උපයන ආදායම
- කෘෂිකාර්මික ඉඩම් වල පුනර්ජනනීය බලශක්ති සඳහා යොදාගන්නා බෝග වගා කිරීමෙන් ලබන ලාභ සහ ආදායම්.

- ශ්‍රී ලාංකික පුරවැසියන් ශ්‍රී ලංකාවෙන් පිටත ඉපැයීම් සඳහා අදාළ සහනදායී බදු අනුපාත පහත පරිදි වේ.
  - තනි පුද්ගලයෙකුගේ වාසිකභාවය තීරණය කිරීම සඳහා පමණක් දින 183 ක රීතිය අදාළ වේ.
  - යම් පුද්ගලයෙකු ශ්‍රී ලංකාවෙන් පිටත ඕනෑම ප්‍රභවයකින් ලබාගන්නා ලාභ සහ ආදායම් ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා ලංකාවට ප්‍රේෂණය කරන්නේ නම් එම ආදායම ආදායම් බද්දෙන් නිදහස් වීම.
  - ශ්‍රී ලංකාවට පැමිණ සහ නැවතී සිටින ද්විත්ව පුරවැසිභාවය සහිත පුද්ගලයන්ගේ ශ්‍රී ලංකාවෙන් පිටත උද්ගතවන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් දැනට පවතින බදු නිදහස, ශ්‍රී ලංකාව සහ වෙනත් රටක පුරවැසිභාවය ලබාසිටින වෙනත් ඕනෑම රටක ස්ථිරව පදිංචි වූ හෝ ඊට සමාන තත්ත්වයක් ඇති පුද්ගලයන් සඳහා ද ව්‍යාප්ත කිරීම.
- අනෙකුත් සහනදායී බදු අනුපාතයන් පහත පරිදි වේ.
  - ඒකක භාර කළමනාකරණ සමාගම් සම්බන්ධයෙන් දැනට පවතින සියයට 28 ක බදු අනුපාතය සියයට 10 දක්වා අඩු කිරීම.
  - ලංකාවෙන් පිටත පුද්ගලයින් වෙත වෘත්තීමය සේවාවන් සපයනු ලබන සුදුසුකම් සහිත සේවා නියුක්තිකයිනට සහ සේවා නියුක්ති ලාභ සම්බන්යෙන් ගුවන් නියමුවන්ට අදාළ වන උපරිම ආදායම් බදු අනුපාතය සියයට 16 දක්වා අඩු කිරීම.
  - සේවා නියුක්තිය අහිමිවීම සම්බන්ධයෙන් පොදුවේ සියලු සේවකයින්ට අදාළ නොවූ වන්දි මුදලක් ලෙස ගෙවනු ලබන සේවා නියුක්ති ආදායම සම්බන්ධයෙන් අදාළ උපරිම බදු අනුපාතය සියයට 16 දක්වා අඩු කිරීම.
  - කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදනය මගින් ලැබෙන ලාභ සඳහා අදාළවන බදු අනුපාතය සියයට 10 දක්වා අඩු කිරීම.
  - විදේශීය නැව් සඳහා සපයන සේවාවන් සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ සඳහා විදේශ ව්‍යවහාර මුදලින් කරනු ලබන ගෙවීම් අපනයන ලෙස සැලකීමට සහ එමගින් ලබාගන්නා ලාභ සහ ආදායම් සඳහා සියයට 12 ක සහනදායී බදු අනුපාතයක් ලබාදීම.
  - ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් විදේශ ව්‍යවහාර මුදල් ඉපැයීමේ ගිණුමක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් ගෙවන ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ විකිණීමෙන් ලබන ආදායම් අපනයන ලෙස සැළකීමටත් එමගින් ලැබෙන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් සියයට 12 ක සහනදායී බදු අනුපාතයක් ලබාදීම.
  - "කාබනික තේ තොග" සාම්ප්‍රදායික නොවන භාණ්ඩ යටතේ වර්ගීකරණය කිරීම සහ ඒ සඳහා සියයට 12 ක සහනදායී බදු අනුපාතයක් ලබාදීම.
  - භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ සේවා සපයන ඕනෑම ව්‍යවසායක් සඳහා සියයට 10 ක සහනදායී බදු අනුපාතයක් ලබාගැනීමට අදාළ වූ රුපියල් මිලියන 300 ක්ව පැවති වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 500 දක්වා වැඩිකිරීම.

- 2013.04.01 දින හෝ ඊට පසු සිය කොටස් ලැයිස්තුගත කරන්නා වූ සහ සියයට 20 ක කොටස් මහජනතාව වෙත නිකුත් කරන සමාගමක් සම්බන්ධයෙන් පවතින බදු අනුපාතය ලැයිස්තුගත කිරීම කරන්නා වූ වසර සහ එළඹෙන වසර 2 සඳහා සියයට 50 කින් අඩු කිරීම.
- කුඩා ප්‍රමාණ ජල විදුලි ව්‍යාපෘතියක් හෝ වෙනත් විකල්ප බලශක්ති ප්‍රභවයක් තුළින් යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් ලබන ලාභ සහ ආදායම් සියයට 12 ක බදු අනුපාතයකට යටත් කිරීම.

- පහත සඳහන් කර්මාන්ත/ක්‍රියාකාරකම්වල සම්පූර්ණ පිරිවැය සඳහා යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණවල ක්ෂයවීම් දීමනා ලබා දීම.

| කර්මාන්ත/ක්‍රියාකාරකම් | අනුමත අනුපාතය |
|---|---|
| තාක්ෂණය ඉහළ නැංවීම හෝ නව තාක්ෂණය හඳුන්වාදීමේ කාර්ය | වසරකට සියයට 50 |
| මුළු බලශක්ති අවශ්‍යතාවයෙන් සියයට 30 කට වඩා විකල්ප බලශක්ති ප්‍රභවයන්ගෙන් සපයා ගැනීමේ සම්පූර්ණ පිරිවැය | සියයට 100 |
| කොළඹ කොටස් හුවමාරුවේ අවශ්‍යතාවයන්ට අනුගතව Broker Back Office System ඇති කිරීමේ පිරිවැය | සියයට 100 |
| ඕනෑම අපනයන කර්මාන්තයක් | වසරකට සියයට 50 |

- රජයේ ආයතනයක් හරහා පර්යේෂණ හා වැඩිදියුණු කිරීම් සිදුකර ගැනීමේ දී ලබාදුන් වියදමෙන් තුන්ගුණයක් අඩුකිරීමේ හැකියාව එම සේවාවන් පුද්ගලික ආයතනයක් හරහා කරගැනීමේ දීත් ලබාදීම.

- සාංගමික ණය සුරැකුම්පත් වල පොලී ආදායම් බද්දෙන් නිදහස් නොමැති අවස්ථාවන්හි දී පහත විධිවිධාන සැලසීම.
    - අදාළ කාලපරිච්ඡේදය සඳහා වූ මුළු පොලිය මත නිකුත් කරනු ලබන අවස්ථාවේ දී අඩු කළයුතු අතර, පාවෙන පොලී අනුපාත මත නිකුත් කර ඇති සුරැකුම් පත් සම්බන්ධයෙන් සමාලෝචනය කරන සෑම කාලපරිච්ඡේදයක් ආරම්භයේදී ම අදාළ සම්පූර්ණ පොලිය මත රඳවා ගැනීමේ බදු අඩු කිරීම.
    - නිකුත් කරන අවස්ථාවේ දී බදු අඩු කර නොමැති නම් 2011 අප්‍රේල් 01 දින හෝ ඊට පසුව ගෙවිය යුතු වන පොලියෙන් බද්ද අඩු කිරීම.

- අදායම් බදු වලට අදාළව දැනට පවත්නා අවුරුදු දෙකක කාල සීමා මාස 18 ක් දක්වා අඩු කිරීම.

- මහ බැංකුව ආර්ථික සේවා ගාස්තුවෙන් නිදහස් කිරීම.

**රාජ්‍ය වියදම**

2012 ජනවාරි 01

- සියලුම රාජ්‍ය නිලධාරීන් (මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන) සඳහා ලබා දුන් විශේෂ දීමනාව සියයට 10 කින් වැඩි කරන ලදී. 2012 ජනවාරි සිට මාණ්ඩලික නොවන පන්තියේ නිලධාරීන් සඳහා දීමනා වැඩිවීම සම්පූර්ණයෙන්ම ද, මාණ්ඩලික පන්තියේ නිලධාරීන් සඳහා දීමනා වැඩිවීමෙන් සියයට 50ක් ද ලබා දුන් අතර මාණ්ඩලික පන්තියේ නිලධාරීන් සඳහා වන දීමනා වැඩිවීමේ ඉතිරිය 2012 ජූලි මස සිට ලබා දෙන ලදී.

- ග්‍රාම නිලධාරීන්, අධිකරණ සේවා කොමිෂන් සභාවට අයත් විනිශ්චයකාරවරුන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් සහ විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල සඳහා ගෙවනු ලබන විවිධ දීමනාවන් වැඩිකරන ලදී.

- 2003 දෙසැම්බර් 31 දින හෝ එයට පෙර විශ්‍රාම ලැබූ රාජ්‍ය සේවකයින් සඳහා ගෙවනු ලබන විශ්‍රාම වැටුප මසකට රුපියල් 1,000 කින් ද, 2004 ජනවාරි 01 හා 2005 දෙසැම්බර් 31 අතර කාලයේ විශ්‍රාම ලැබූවන් සඳහා ගෙවනු ලබන විශ්‍රාම වැටුප මසකට රුපියල් 500 කින් ද වැඩි කරන ලදී.

2012 පෙබරවාරි 13 - ධීවර කර්මාන්තයේ දී යොදාගනු ලබන භූමිතෙල් යාත්‍රා සහ ඩීසල් යාත්‍රා සඳහා පිළිවෙළින් ලීටරයකට රුපියල් 25 ක සහ ලීටරයකට රුපියල් 12 ක සහනාධාරයක් ලබාදෙන ලදී.

2012 පෙබරවාරි 15 - විදුලිය නොමැති සියලු කුටුම්භයන් සඳහා මාසිකව රුපියල් 200 ක භූමිතෙල් සහනාධාරයක් ලබාදෙන ලදී.

2012 අප්‍රේල් 01 - අඩු ආදායම් ලබන පවුල් සඳහා දෙනු ලබන සමෘද්ධි සහනාධාරය පහත පරිදි වැඩි කරන ලදී.

| පැවති දීමනාව (රුපියල්) | නව දීමනාව (රුපියල්) |
|---|---|
| 250 - 615 | 750 |
| 900 | 1,200 |
| 1,500 | 1,500 |

### මුදල් අංශය

2012 පෙබරවාරි 03 - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.50 සහ සියයට 9.00 දක්වා පදනම් අංක 50 කින් වැඩිකරන ලදී.

2012 පෙබරවාරි 09 - විනිමය අනුපාතිකයේ අගය වඩාත් නම්‍යශීලීව තීරණය වීමට ඉඩ හරිමින්, මිල ඉලක්කගත ක්‍රමයෙන් ඉවත්ව විදේශ විනිමය වෙළඳපොල මැදිහත්වීම් පරිමාව ඉලක්කගත ක්‍රමයට සීමා කිරීමට තීරණය කරන ලදී.

2012 මාර්තු 12 - බලපත්‍රලාභී බැංකුවල 2012 වසරේ රුපියල්වලින් නාමනය කරන ලද ණයෙහි වර්ධනය සියයට 18 ක් හෝ රුපියල් මිලියන 800 ක් යන අගයන්වලින් ඉහළ අගයට සීමාකිරීමට නියම කරන ලදී. එසේ වුවද ණය දීම සඳහා අවශ්‍ය අරමුදල් විදේශයන්ගෙන් සපයාගන්නා බැංකු සඳහා සියයට 23 ක් හෝ රුපියල් බිලියන 1 ක් යන අගයන්වලින් ඉහළ අගය දක්වා ණය වර්ධන සීමාවන් ලබා දෙන ලදී.

2012 මාර්තු 15 - මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන දිනවලදී එක් සහභාගිත්ව ආයතනයකට නිත්‍ය පහසුකම යටතේ ලබාගත හැකි දෛනික ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය රුපියල් මිලියන 100 ක උපරිමයකට සීමාකරන ලදී.

2012 අප්‍රේල් 05 - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සියයට 7.75 දක්වා පදනම් අංක 25 කින් වැඩිකළ අතර, ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 9.75 දක්වා පදනම් අංක 75කින් වැඩිකරන ලදී.

2012 දෙසැම්බර් 12 - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.50 සහ සියයට 9.50 දක්වා පදනම් අංක 25 බැගින් අඩු කරන ලදී.

2012 දෙසැම්බර් 31 - ලියාපදිංචි බැංකුවල ණය වර්ධනයට පනවා තිබූ සීමා කිරීම ඉවත් කරන ලදී.

## මූල්‍ය අංශය

**ලියාපදිංචි බැංකු**

| | | |
|---|---|---|
| 2012 ජනවාරි 02 | - | පිබිදෙන උතුර චක්‍රීය අරමුදල-II වන අදියර ණය යෝජනා ක්‍රමය සහ නැගෙනහිර පළාතේ ආර්ථික කටයුතු යළි නගා සිටුවීම සඳහා වන චක්‍රීය අරමුදල - II වන අදියර ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. |
| 2012 මාර්තු 02 | - | එ.ජ. ඩොලර් මිලියන 1 ක අවම සීමාවකට යටත්ව, විදේශ විනිමයන්හි දෛනික කාරක ශේෂයට අදාළව වාණිජ බැංකුවල ශුද්ධ අනාවරණ තත්ත්වය සඳහා වූ විදේශ විනිමය සීමාව ඒ වන විට පැවති සීමාවෙන් තුනෙන් එකක් දක්වා අඩු කරන ලදී. |
| | - | වාණිජ බැංකුවල ශුද්ධ අනාවරණ තත්ත්වයන්හි සම්පූර්ණ අගය එ.ජ.ඩොලර් මිලියන 64.7 දක්වා අඩු කරන ලදී. |
| 2012 මාර්තු 19 | - | ජ්‍යෙෂ්ඨ පුරවැසිභාවය තීරණය කිරීමට අදාළ පොදු වයස් සීමාව අවුරුදු 55 ලෙස සළකන මෙන් බලපත්‍රලාභී බැංකු වලට උපදෙස් දෙන ලදී. |
| 2012 අප්‍රේල් 05 | - | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 32, 39 සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 7 ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව කෙටුම්පත් කළ උපදෙස් මාලාවක් සහ බැංකුවල ත්‍රෛමාසික හා වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත්කිරීමට අදාළ කෙටුම්පත් ආකෘතීන් නිකුත් කරන ලදී. |
| 2012 අප්‍රේල් 17 | - | වෙළඳපොල පොලී අනුපාතිකයන්ගේ උපනතීන් සැලකිල්ලට ගෙන, බලපත්‍රලාභී බැංකු විසින් නිවාස ණය සහ ණයපත් අත්තිකාරම් මත අයකළ හැකි උපරිම වාර්ෂික පොලී අනුපාතිකයන් පිළිවෙලින් සියයට 16 සහ සියයට 28 දක්වා ඉහළ නංවන ලදී. |
| 2012 අප්‍රේල් 24 | - | බලපත්‍රලාභී බැංකුවල සියළු අවදානම්වලට නිරාවරණය වීම් ආවරණය කිරීම සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉක්මවා ප්‍රාග්ධනය පවත්වාගෙන යන බව තහවුරු කිරීමට බාසල් II සම්මුතියේ 2 වන ආධාරකය වන අධීක්ෂණ විමසුම් ක්‍රියාවලිය යටතේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණත්මතා ඇගයීම් ක්‍රියාවලිය සම්බන්ධව අදහස් විමසීමේ ලියවිල්ලක් නිකුත් කරන ලදී. |
| 2012 ජූලි 17 | - | අධ්‍යක්ෂවරුන් විශ්‍රාමයෑමේ දී සාමාන්‍යයෙන් සිදුකරන ගෙවීම්/ප්‍රතිලාභවලට අමතරව බැංකුව විසින් ලබාදෙන විශේෂ ගෙවීම්/ප්‍රතිලාභ සඳහා කොටස්කරුවන්ගේ පූර්ව අනුමැතිය ලබාගන්නා ලෙස ද, එවැනි විශේෂ ගෙවීම්/ප්‍රතිලාභ බැංකුවේ පාරිතෝෂික ප්‍රතිපත්තියට ඇතුලත් කරන ලෙස ද මෙරට සංස්ථාපිත බලපත්‍රලාභී බැංකුවලට දැනුම් දෙන ලදී. තවද, එවැනි විශේෂ ගෙවීම්/ප්‍රතිලාභ අතේ දුරින් සිදුවන ගනුදෙණුවක ස්වභාවයෙන් සිදුකරන ලෙසටත්, වර්ෂය තුල සිදුකළ එවැනි ගෙවීම්වල එකතුව අදාළ වසරේ වාර්ෂික වාර්තාව තුලින් හෙළිදරව් කරන ලෙසටත් අදාළ බැංකුවලට දැනුම් දෙන ලදී. |
| 2012 සැප්තැම්බර් 18 | - | ශ්‍රී ලංකාවේ විදේශ විනිමය වෙළෙඳාම් කටයුතුවල මනා පැවැත්ම උදෙසා ඊට අදාළ ව්‍යාපාර කටයුතු සහ වෙළෙඳපොළ පරිචයන් ඉහළ ප්‍රමිතියකට පත් කිරීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය වෙළෙඳාම් කටයුතු සිදු කළයුතු ආකාරය සම්බන්ධව විධානයන් නිකුත් කරන ලදී. |
| 2012 ඔක්තෝබර් 15 | - | බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීල වත්කම් අනුපාතය ගණනය කිරීමේ දී එම බැංකුවල ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ ඇති රජයේ සුරැකුම්පත්, ද්‍රවශීල වත්කම් ලෙස සැලකිය හැකි බව නිර්ණය කරන ලදී. |
| 2012 නොවැම්බර් 29 | - | බැංකු ශාඛා අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා දැනට පවත්නා බැංකු සේවා ස්ථාන, බැංකු ශාඛා සහ ශිෂ්‍ය ඉතුරුම් ඒකක යන දෙවර්ගයට නැවත වර්ගීකරණය කරන ලෙස බලපත්‍රලාභී බැංකුවලට දන්වන ලදී. ඒ අනුව, 2013 ජනවාරි මස 01 දින සිට ශිෂ්‍ය ඉතුරුම් ඒකක හැර අනෙකුත් සියලු බැංකු සේවා ස්ථාන බැංකු ශාඛා මට්ටමට උසස් කළ යුතුය. කිසියම් ශාඛාවක් තෝරාගත් බැංකු සේවාවන් පමණක් ලබා දෙන්නේ නම් එම සේවාවන්හි ලැයිස්තුවක් ගනුදෙනුකරුවන්ගේ දැනගැනීම පිණිස එම පරිශ්‍රය තුළ පැහැදිලිව ප්‍රදර්ශනය කරන ලෙසට ද බලපත්‍රලාභී බැංකුවලට නියම කරන ලදී. |

2012 දෙසැම්බර් 07 - බලපත්‍රලාභී බැංකුවලට අදාළ සියලුම නියාමන අවශ්‍යතාවයන් සඳහා බාහිර ණය තක්සේරු කිරීමේ ආයතනයක් ලෙස යොදාගත හැකි වන පරිදි ඉන්දියාවේ ICRA ලිමිටඩ් වෙත පූර්ණ හිමිකාරිත්වය ඇති පාලිත සමාගමක් වන ICRA ලංකා ලිමිටඩ් සමාගම පිළිගන්නා ලදී.

2012 දෙසැම්බර් 21 - අභ්‍යන්තර විගණන සහ තොරතුරු තාක්ෂණ කටයුතු ද ඇතුලත්ව බලපත්‍රලාභී බැංකුවකට බාහිරින් සේවා ලබාගත හැකි කාර්යයන් ඇතුලත් විධානයක් නිකුත් කරන ලදී.

2013 ජනවාරි 02 - වාණිජ බැංකුවක ශුද්ධ අනාවරණ තත්ත්වය එ.ජ.ඩොලර් මිලියන 120 දක්වා ඉහළ නංවන ලදී.

**අපේක්ෂිත**

- බාසල් II ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා රාමුව යටතේ වූ අවශ්‍යතාවයන්ට අනුගත වීම.
  - මෙහෙයුම් අවදානම් සඳහා ප්‍රාග්ධන බැඳීම ගණනය කිරීම සඳහා 1 වන ආධාරකය යටතේ උසස් ප්‍රමිතිගත ප්‍රවේශයක් තෝරාගැනීම.
  - දෙවන ආධාරකය යටතේ අධීක්ෂණ විමසුම් ක්‍රියාවලිය පිහිටුවාලීම.
- බාසල් III සඳහා අනුකූල වන පරිදි සුදුසු ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම.
- බැංකු සමූහ ඒකාබද්ධව අධීක්ෂණය කිරීම සඳහා පුළුල් අධීක්ෂණ රාමුවක් සකස් කිරීම.
- ලංකා සෙට්ල් පද්ධති රීති මාලාවෙහි දෙවන වෙළුම ප්‍රකාශයට පත් කරන ලද දින සිට පද්ධතියට සිදු කරන ලද සියලුම වෙනස්කම් ඇතුළත් වන පරිදි සංශෝධනය කරන ලද පද්ධති රීති මාලාව නිකුත් කිරීම.
- ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධතිවල ඇති වූ වර්ධනයන් සහ මාර්ගෝපදේශයන් ප්‍රායෝගිකව බලාත්මක කිරීමේ දී ඇතිවුන තත්ත්වයන් සැලකිල්ලට ගෙන බැංකු මූලික ගෙවීම් සේවා සඳහා වූ 2011 අංක 01 දරන ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් ක්‍රම සඳහා වූ මාර්ගෝපදේශ සංශෝධනය කිරීම.
- ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් සකස් කිරීම සඳහා වූ සංශෝධිත මාර්ගෝපදේශ මාලාව නිකුත් කිරීම.

**අනෙකුත් මූල්‍ය ආයතන**

2012 පෙබරවාරි 27 - නව මුදල් ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කිරීමේ ක්‍රියාවලිය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත හා අනුකූල කිරීමට මුදල් සමාගම් අයදුම්පත් රීතිය නිකුත් කරන ලදී.

- මුදල් සමාගම්වලට අදාළ වාර්ෂික බලපත්‍ර ගාස්තු සංශෝධනය කරන ලදී.

2012 මාර්තු 29 - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් මගින් භාවිත කළ මූලික ප්‍රාග්ධනය සඳහා වන නිර්වචනය බාසල් II අනුව සංශෝධනය කරන ලදී.

- ප්‍රාග්ධන අරමුදල්, ප්‍රතිප්‍රමාණ සංචිත ඇතුළුව විවිධාකාර සංචිතවලින් සමන්විත බැවින් විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන මගින් තෝලන අනුපාත ගණනය කිරීමේ දී ප්‍රාග්ධන අරමුදල් වෙනුවට ඒ සඳහා මූලික ප්‍රාග්ධනය මිණුමක් ලෙස යොදා ගැනීම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට නියම කිරීම සඳහා තෝලන අනුපාත විධානය නිකුත් කරන ලදී.

2012 ජූලි 11 - අධ්‍යක්ෂ මණ්ඩලයේ හා විධායක කාර්යන්හි නියුතු නිලධාරීන්ගේ යෝග්‍යතාවය නිර්ණය කිරීම සම්බන්ධයෙන් වන විධානයක් සියළුම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

- ද්‍රවශීලී වත්කම් විධානය මගින් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා වන ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය ගණනය කිරීමේ දී භාවිතා කළ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතමයන්ගෙන් හා මුළු වගකීම් හි ඇතුලත්ව තිබූ කොටස් හිමියන් වෙත ඇති වගකීම්, වත්කම් වලින් සුරක්ෂිත දිගුකාලීන ණය ගැනීම් හා සුරැකුම්කරණ ණය ඉවත් කරන ලදී.

2012 සැප්තැම්බර් 06 - අවම වශයෙන් පිවිසුම් පාලන ක්‍රම, මිලදී ගැනීම් සහ පවත්වා ගැනීම්, ජාල කළමණාකරණය, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්, තොරතුරු පද්ධති විගණනයන් හා මෘදුකාංග බලපත්‍ර ලබා ගැනීම යන අංශයන්ගෙන් සමන්විත තොරතුරු පද්ධති ආරක්ෂණ ප්‍රතිපත්තීන් සමග අනුකූල වීම තහවුරු කිරීම අරමුණු කොටගෙන බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත තොරතුරු පද්ධති ආරක්ෂණ ප්‍රතිපත්ති විධානය නිකුත් කරන ලදී.

2012 ඔක්තෝබර් 23 - බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හි බාහිර විගණනයන් දක්ෂ හා සුදුසුකම් ලත් විගණකවරුන් විසින් සිදුකිරීම තහවුරු කිරීම උදෙසා පිළිවෙලින් 2012 අංක 1 දරන මුදල් සමාගම් (බාහිර විගණක මඬුල්ල) චක්‍රලේඛය හා 2012 අංක 5 දරන කල්බදු මූල්‍යකරණ (බාහිර විගණක මඬුල්ල) විධානය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මඟින් පත්කළ බාහිර විගණක මඬුල්ලෙන් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් බාහිර විගණකවරයෙකු පත්කර ගැනීම සඳහා නිකුත් කරන ලදී.

2012 දෙසැම්බර් 28 - මූල්‍ය වෙළඳපොලෙහි පවතින පොලී අනුපාතයන් සමග ගැලපෙන පරිදි 2012 වර්ෂය තුල පොලී අනුපාත විධානය පස් වතාවක් සංශෝධනය කරන ලදී. කාලීන තැන්පතු හා පැවරිය නොහැකි තැන්පතු සහතික සඳහා සිදු කරනු ලද පොලී අනුපාත ආන්තික සංශෝධන පහත දැක්වේ.

| විධානය සංශෝධනය කළ දිනය | කාර්තුව තුළ දී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාළ බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය | පොලී අනුපාත ආන්තිකය (ප්‍රතිශතය) | | |
|---|---|---|---|---|
| | | වසරක් හෝ ඊට අඩු | වසරකට වැඩි | |
| 2012.02.29 | 9.23 | 5.50 | 6.50 | |
| 2012.05.29 | 10.82 | 4.75 | 5.75 | |
| 2012.06.29 | 10.82 | 3.00 | 4.00 | |
| 2012.09.28 | 13.79 | 2.00 | 3.00 | |
| | | | වසරකට වැඩි සහ වසර 3 දක්වා: | වසර 3 කට වැඩි හා වසර 5 ක් දක්වා: |
| 2012.12.28 | 14.65 | 2.00 | 2.50 | 3.00 |

මුදල් සමාගම් විසින් කාලීන තැන්පතු හා පැවරිය නොහැකි තැන්පතු සහතික රැස් කිරීම සඳහා පිරිනැමූ උපරිම පොලී අනුපාතිකය, කාර්තුව තුලදී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා අදාල බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගයෙන් හා පොලී අනුපාත ආන්තිකයෙහි එකතුවෙන් සමන්විත වේ.

2012 දෙසැම්බර් 31 - බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හි බාහිර විගණනයන් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තෝරාගත් බාහිර විගණක මඬුල්ල වෙත බැංකු නොවන මූල්‍ය ආයතන වල විගණනයන් ඉහළ සංස්ථායීත්වයක් හා ඒ සඳහා සම්මත ක්‍රියා පටිපාටියක් පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා මෙම උපදෙස් මාලාවන් නිකුත් කරන ලදී.

**අනෙකුත්**

2012 ජනවාරි 17 - කොටස් තැරැව්කරුවන් විසින් ආයෝජකයන්ට ලබාදෙන ණය ඔවුන්ගේ ගැලපූ ශුද්ධ ප්‍රාග්ධනයේ අගය මෙන් තුන් ගුණයක් දක්වා වැඩි කිරීමට අවසර ලබාදෙන ලදී.

2012 පෙබරවාරි 09 - සේවක අර්ථසාධක අරමුදල් පනත 2012 අංක 2 දරන සංශෝධනය මගින් පහත සඳහන් ප්‍රතිපාදන සලසා ඇත.

- සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට, තම පෞද්ගලික ශේෂයෙන් සියයට 30 ක මුදලක් වෛද්‍ය ප්‍රතිකාර හෝ නිවාස කටයුතු සඳහා ආපසු ලබා ගැනීමට අවස්ථාව සලසන ලදී. සාමාජික ගිණුමේ ශේෂය රුපියල් 300,000 ඉක්මවන දැනට සේවයේ නියුතු සාමාජිකයන්ට හා අවුරුදු දහයකට නොඅඩු කාලසීමාවක් අරමුදලට දායක වී ඇති සාමාජිකයන්ට මෙම පහසුකම ලබාගත හැක.
- සේවකයන් පනහට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුතු සේවායෝජකයන් සියලුදෙනා සෑම මාසයක් අවසානයේදීම මාසික වාර්තාවක් කම්කරු කොමසාරිස් ජෙනරාල්තුමා වෙත ලබා දීමට උපදෙස් දී ඇති අතර එහි පිටපතක් මහ බැංකුවේ සේවක අර්ථසාධක දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්වීමට කටයුතු කළ යුතුය. 2012 ජූලි මස 01 ට පසුව මාසිකව දායක මුදල් ගෙවීම විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සිදුකළ යුතුය.
- සේවකයෙකු අරමුදලේ සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු ඔහුට හෝ ඇයට, කම්කරු කොමසාරිස් ජෙනරාල් විසින් හඳුනාගැනීමේ අංකයක්, නිර්දේශ කරන ලද පිළිවෙතකට අනුව වෙන් කරන ලදී.
- සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රයෝජනයට කාර්යාලයක් ගොඩනැගීම සඳහා නිර්දේශ කරන ලද පිළිවෙතකට සහ කොන්දේසිවලට අනුව අරමුදලේ මුදල් ආයෝජනය කර ඉඩමක් මිල දී ගැනීමට හෝ අරමුදලට අයත් ඉඩමක කාර්යාලයක් ගොඩනැගීම.

2012 පෙබරවාරි 28 - මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාලව මෙතෙක් පැවති 40 + 9 නිර්දේශ, මූල්‍ය කාර්යසාධන බලකාය විසින් (Financial Action Task Force) බලාත්මක වන පරිදි සංශෝධනය කරන ලදී.

2012 මාර්තු 02 - කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගතවීමට අපේක්ෂා කරන පොදු සමාගම් ලැයිස්තුගත කිරීමට අදාළව අතිරේක රෙගුලාසි පහත පරිදි හඳුන්වා දෙන ලදී.

- හඳුන්වාදීමක් මගින් කොටස් ලැයිස්තුගත කිරීමට අදාළව විධිවිධානය 2012 අප්‍රේල් 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කිරීම.
- මහජනයාට දායකවීම සඳහා නිකුත් කරන නව කොටස් මගින් ලැයිස්තුගත කිරීමේ මූලික මහජන අර්පණයකට පෙර එම සමාගම විසින් නිකුත් කර ඇති සියලුම කොටස් සඳහා ගනුදෙනු නොකර තබාගැනීමේ කාලයක් හඳුන්වා දෙනු ලැබීය.
- දැනටමත් තිබෙන, කොටස් නිකුත් කිරීම සඳහා මහජනයාට කරන අර්පණයක් මගින් ලැයිස්තුගත කිරීමේ මූලික මහජන අර්පණයක දී විකිණීමට අදාළ කොටස්වල හිමිකරුවන් විසින් එම කොටස් අවම වශයෙන් මාස 18 ක් වත් නොවිකුණා තිබිය යුතු වේ.
- නිකුත් කරනු ලැබූ කොටස් සහ මූලික මහජන නිකුතුන් මාර්ගයෙන් මහජනයා විසින් පිළිගනු ලැබූ කොටස් හැර, ප්‍රවර්ධකයන් සහ දැනට සිටින කොටස් හිමිකරුවන් මගින් රඳවාගෙන ඇති සියලුම කොටස් සඳහා ගනුදෙනු නොකර තබාගැනීමේ කාලසීමාවක් හඳුන්වාදෙනු ලැබීය.

2012 අප්‍රේල් 02 - සුරැකුම්පත් හා විනිමය කොමිසම විසින් කොළඹ කොටස් වෙළෙඳපොළට සහ සියලු ලැයිස්තුගත සමාගම් වෙත නිකුත් කර ඇති විධානය අනුව ද්විතීයික වෙළෙඳපොළෙහි ගනුදෙනු කරනු ලබන බලපත්‍ර එහි මූලික දිනයෙන් පසුව ගනුදෙනු කිරීම තහනම් කරන ලදී.

2012 අප්‍රේල් 19 - සුරැකුම්පත් හා විනිමය කොමිසම විසින් වෙළෙඳපොළ දින 5 ක් සඳහා පනවා තිබූ සියයට 10 ක මිල පරාස නීතිය ඉවත් කරන ලදී.

2012 මැයි 4 - 2011 මාර්තු 28 දිනැති අංක 1699/10 අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2011 අංක 1 දරන, බලපත්‍රලාභී බැංකු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් ගනුදෙනුකරු හඳුනාගැනීමේ (KYC) සහ ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ (CDD) රීති අංක 1756/27 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධනය කරන ලදී.

2012 මැයි 25 - දැනට පවත්නා ගනුදෙනු දිනය (T) සහ පියවීම් සිදුවන දිනය (T+3) අතර ඇති විය හැකි පියවීම් අවදානම අවම කර ගැනීමේ අරමුණින් යුතුව පහත සඳහන් අන්තර් තීරණ හඳුන්වා දෙනු ලැබීය.

- කොටස් වෙළෙඳපොළ ගනුදෙනුවලට සම්බන්ධ අතරමැදි ආයතනවල අධ්‍යක්ෂවරුන් හා සේවාදායකයන්හට තමන් කොටස් මිල දී ගත් දිනයේ සිට මාස හයක් යනතුරු එම කොටස් විකිණීම තහනම් කරන ලදී.
- කොළඹ කොටස් වෙළෙඳපොළේ විශේෂිත අනුමැතියක් නොමැතිව කෙරෙන සාකච්ඡා ගනුදෙනු (Crossing Transaction) සඳහා උපරිම මිල මට්ටම විය හැක්කේ පෙර දින අවසන් ගනුදෙනුවේ සිට සියයට 20 කි.
- ගනුදෙනු කිරීමට පෙර ගෙවිය යුතු සියයට 15 ක ආන්තික මුදල ඇඩ්ව ක්‍රියාත්මක කිරීම. මෙය ජාතික ඉතිරි කිරීමේ බැංකුවට ද අදාළය.
- කොටස් තැරැව්කාර ආයතන, එහි ප්‍රධාන විධායක නිලධාරීන්, අධ්‍යක්ෂවරුන් සහ ආයෝජන උපදේශකවරුන් විසින් සිදුකරන නීති උල්ලංඝනය කිරීම් සඳහා පැහැදිලිව නිර්වචනය කර ඇති දඬුවම් නීති පද්ධතියක් සහ ඒවා බලාත්මක කිරීමේ ක්‍රමවේදයක් ඇති කර ගැනීම.

2012 ජූලි 16 - කොටස් තැරැව්කරුවන් විසින් ඔවුන්ගේ සේවාලාභීන්ට ලබා දී ඇති ණය කළමනාකරණයේ නම්‍යශීලීභාවය වැඩිදියුණු කිරීමේ අතරමැදි පියවරක් ලෙස ඔවුන්ගේ ශුද්ධ ප්‍රාග්ධනය ගණනය හා සම්බන්ධව සංශෝධන ඇතුළත් පහත සඳහන් විධාන, සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාව විසින් කොළඹ කොටස් හුවමාරුවට නිකුත් කරනු ලැබීය.

- කාලපරිච්ඡේදය සඳහා සිදුකර ඇති පිරිවැය (වෙන්කිරීම් ඉවත් කළ පසු) වෙළෙඳපොළ වටිනාකමට වඩා වැඩිනම්, ලිත් දින T+3 -T+30 අතර ණයගැතියන් අඩු කිරීම.
- වෙන්කිරීම් ඉවත් කළ පසු සිදුවන පිරිවැය සියයට 50 දී ලිත් දින T+30 ට වඩා වැඩි ණයගැතියන් ඉවත් කිරීම.
- වෙන්කිරීම් ඉවත් කළ පසු සිදුවන පිරිවැය සියයට 100 දී ලිත් දින T+120 ට වැඩි ණයගැතියන් අඩු කිරීම.

2012 ඔක්තෝබර් 08 - සුරැකුම්පත් හා විනිමය කොමිසම විසින් 2012 මැයි මාසයේ දී පනවනු ලැබූ පහත සීමාවන් ඉවත් කරන ලදී.

- කොටස් වෙළඳපොල ගනුදෙණුවලට සම්බන්ධ අතරමැදි ආයතන වල අධ්‍යක්ෂවරුන් සහ සේවාදායකයන් හට තමන් කොටස් මිලදී ගත් දිනයේ සිට මාස හයක් යනතුරු එම කොටස් විකිණීම තහනම් කිරීම.
- කොළඹ කොටස් වෙළෙඳපොලේ විශේෂිත අනුමැතියක් නොමැතිව කෙරෙන සාකච්ඡා ගණුදෙනු (Crossing Trasaction) සඳහා උපරිම මිල මට්ටම වන පෙර දිනයේ අවසන් ගනුදෙණුවේ සිට සියයට 20.

2013 පෙබරවාරි 15 - මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ මුදල් තැරැව්කාර ක්‍රියාකාරකම් නියාමනයට අදාළ රෙගුලාසි නිකුත් කරන ලදී.